# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2260/72 - 2021 දෙසැම්බර් මස 31 වැනි සිකුරාදා - 2021.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැඩබලන මුදල් අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2022 ජනවාරි මස 01 වැනි දින සිට ආරම්භ වන මාස 06 කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2021 ඔක්තෝබර් මස 13 දිනැති අංක 2249/16 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් අර්තාපල් (රේගු සංකේතාංක අංක 0701.90) සඳහා ප්‍රකාශිත නියමය සහ 2021 සැප්තැම්බර් මස 07 දිනැති අංක 2244/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් බොම්බයි ළූණු (රේගු සංකේතාංක අංක 0703.10.20) සඳහා ප්‍රකාශිත නියමය 2022 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි අවලංගු කරමි.

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
වැඩබලන මුදල් අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළෙඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 01. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු. 20/- |
| 02. | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු. 10/- |